# නියමයන් සහ කොන්දේසි - Bucket List

පහත සඳහන් නියමයන් සහ කොන්දේසි FriMi හරහා විවෘත කරන ලද සියලුම Bucket List ගිණුම් පාලනය කරනු ඇත.

**පහත "පිළිගනිමි" යන බොත්තම එබීමෙන්, ගනුදෙනුකරු පහත පරිදි**

> **එනම් මෙම නියමයන් සහ කොන්දේසි,** Bucket List **නිෂ්පාදනයට අදාළ විස්තර සමඟ ගනුදෙනුකරුට පැහැදිලි කර ඇති බවත් ගනුදෙනුකරු මෙම නියමයන්, කොන්දේසි සහ එවැනි විස්තර කියවා තේරුම් ගෙන ඇති බවත් ඒ අනුව බැඳී සිටීමටඑකඟත්වය හා කැමැත්ත දක්වා ඇති බවත් තහවුරු කරයි.**

## ගිණුම් විවෘත කිරීම

1. KYC සත්‍යාපනය සම්පූර්ණ කිරීම අනුව බැංකුව විසින් සක්‍රිය කර ඇති FriMi ඉතුරුම් ගිණුමක් ඇති ගනුදෙනුකරුවෙකුට Bucket List ගිණුමක් විවෘත කළ හැක.
2. සෑම Bucket List එකකටම අනුරූප Bucket List ගිණුමක් විවෘත කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, මෙම නියමයන් සහ කොන්දේසි පිළිගැනීමෙන්, ගනුදෙනුකරු විසින් බැංකුවට සපයන ලද නවතම KYC තොරතුරු භාවිතා කරමින්, ගනුදෙනුකරුගේ නමින් Bucket List ගිණුමක් විවෘත කිරීමට ගනුදෙනුකරු කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.
3. Bucket List ගිණුමක් හරහා බැර සහ හර පහත සඳහන් ගනුදෙනුවලට සීමා කෙරේ.
    - මාසික වාරික සඳහා අරමුදල් සැපයීමට FriMi ඉතුරුම් ගිණුමෙන් මාරු කිරීම්; සහ
    - Bucket List ගිණුමක් වසා දැමීමෙන් FriMi ඉතුරුම් ගිණුමට මාරු කිරීම.

   Bucket List ගිණුමෙන් ඕනෑම අවස්ථාවක මුදල් ආපසු ගැනීමට ගනුදෙනුකරුට අවසර නොදෙන අයුරින් Bucket List ගිණුම හරහා හර ගනුදෙනු ඇවිරීමක් සිදු කෙරේ.
4. සෑම Bucket List ගිණුමක්ම FriMi හි පවත්වාගෙන යනු ලබන ගිණුම් ගණයට වැටෙන අතර Bucket List ගිණුම් සම්බන්ධයෙන් අදාළ වන පොලී අනුපාතය සහ බදු FriMi යෙදුම(app) තුළ ප්‍රකාශයට පත් කෙරේ.
5. Bucket List ගිණුම් සඳහා ගනුදෙනුකරුට ඉලෙක්ට්‍රොනික ගිණුම් ප්‍රකාශ නිකුත් නොකරනු ඇති අතර ගනුදෙනුකරුට FriMi යෙදුම හරහා Bucket List ගිණුම්වල ගනුදෙනු පරීක්ෂා කළ හැකි වේ. කඩදාසි මත පදනම් වූ ගිණුම් ප්‍රකාශ නිකුත් කරනු ලබන්නේ පවතින බැංකු ගාස්තුවලට යටත්ව ඉල්ලීම මත පමණි.
6. සෑම Bucket List ගිණුමකටම ගිණුම් අංකයක් ලබා දෙනු ඇති අතර එය බැංකුව සමඟ ඇති සියලුම ලිපි හුවමාරුවන් හි දී සඳහන් කළ යුතුය.

## කල්පිරීම/ඉලක්ක මුදල සහ කල්පිරීමේ දිනය

7. Bucket List සඳහා FriMi යෙදුමේ සඳහන් වන පරිදි අවම කල්පිරීමේ ඉලක්ක මුදලක් අවශ්‍ය වේ.

8. කල්පිරෙන දිනයේදී ගනුදෙනුකරුට කල්පිරීමේ ඉලක්ක මුදල ලබා ගත හැක්කේ, එක් එක් Bucket List නියමිත දිනට ගනුදෙනුකරු විසින් අවශ්‍ය මාසික වාරික ගණන තැන්පත් කළහොත් පමණි.

9. අවම වශයෙන් මාස 2 ක කාල සීමාව කින් හෝ බැංකුව විසින් කලින් කලට නියම කළ හැකි වෙනත් කාල සීමාවක කින් කල්පිරීමේ ඉලක්ක මුදල ලබා ගැනීමට ගනුදෙනුකරුට තෝරා ගත හැකිය.

10. ගනුදෙනුකරුට දැනුම් දීමක් සහිතව නව Bucket List සඳහා අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විට දී කල්පිරීමේ ඉලක්ක මුදල වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇත.

11. ගනුදෙනුකරු Bucket List නිර්මාණය කරන අවස්ථාවේ දී, ගනුදෙනුකරුගේ අවශ්‍යතාවය මත පදනම්ව පහත විස්තර ඇතුළත් කළ යුතුය:

- Bucket List හි නම
- කල්පිරීමේ ඉලක්ක මුදල
- ආරම්භක දිනය
- කල් පිරෙන දිනය
- මූලික තැන්පතු මුදල

12. ගනුදෙනුකරු විසින් ඇතුලත් කරන ලද Bucket List හි නම හැර, ඉහත 11 වගන්තිය යටතේ සපයා ඇති කිසිදු විස්තරයක් ගනුදෙනුකරුට සංශෝධනය කළ නොහැක.

13. Bucket List නිර්මාණය කරන අවස්ථාවේ දී ගනුදෙනුකරු විසින් තෝරා ගන්නා ලද කල් පිරීමේ දිනයේදී කල්පිරීමේ දී ඉලක්කගත මුදල සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් මාසික වාරික මුදල ගණනය කර වාරිකය ගෙවීම සඳහා නියමිත දිනය පිළිබඳව FriMi යෙදුමේ ම උපදෙස් දෙනු ඇත.

**වාරික**

14. කල්පිරීමේ දී ඉලක්කගත මුදල, මූලික තැන්පතුව සහ ආයෝජන කාලය සැලකිල්ලට ගනිමින් බැංකුව විසින් මාසික වාරික මුදල ගණනය කරනු ලැබේ.
15. Bucket List ගිණුමට තැන්පත් කර ඇති මුදල් සම්බන්ධයෙන් මුදල් ආපසු ගෙවීමට/ආපසු හැරවීමට අවසර නොදේ.
16. මාසික වාරික මුදල නියමිත දිනට ස්වයංක්‍රීයව FriMi ඉතුරුම් ගිණුමෙන් (ප්‍රමාණවත් අරමුදල් තිබේ නම්) මාරු කරනු ලැබේ.

**කල් පිරීමේ දී පොලී සහ ගෙවීම්**

17. Bucket List ගිණුම විවෘත කරන අවස්ථාවේ බැංකුව විසින් නියම කරන ලද නේෂන්ස් සේවර් ඉතුරුම් පොලී අනුපාතය" Bucket List ගිණුමේ දෛනික ශේෂය මත බැංකුව විසින් ගණනය කරනු ලබන අතර කල් පිරෙන දිනය දක්වා මාසිකව Bucket List ගිණුමට බැර කරනු ලැබේ.

18. ගනුදෙනුකරුට සිදු කරන දැනුම්දීමක් සමඟ Bucket List ගිණුම සඳහා ගෙවිය යුතු පොලී අනුපාතය වෙනස් කිරීමට හෝ විචලනය කිරීමට බැංකුවට අයිතියක් ඇත.

19.ගනුදෙනුකරු විසින් නියමිත දිනට නියමිත මාසික වාරික ප්‍රමාණය තැන්පත් කර ඇත්නම්, කල් පිරෙන දිනයේ හෝ නීතියෙන් නියම කර ඇති පරිදි ආයෝජන කාලය තුළ ගෙවිය යුතු බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත බදු අඩු කිරීමට යටත්ව උපයාගත් පොලිය ද ඇතුළුව ගනුදෙනුකරුගේ Bucket List ගිණුම කල්පිරෙන දිනයේදී කල්පිරීමේ ඉලක්ක මුදල දරනු ඇත,

## BUCKET LIST ගිණුම අවසන් කිරීම

20. කල් පිරෙන දිනට පෙර හෝ එදිනට පසු ගනුදෙනුකරුට Bucket List ගිණුම වසා දැමිය හැක. කල් පිරෙන දිනයේ හෝ ඊට පසු Bucket List ගිණුම වසා නොදැමීමට ගනුදෙනුකරු තීරණය කරන්නේ නම්, පවතින Bucket List ගිණුම් පොලී අනුපාතයට අනුව, පවතින ශේෂය මත ගනුදෙනුකරු දිගටම පොලී උපයනු ඇත.
21. ගනුදෙනුකරු Bucket List ගිණුම වැසීමට තීරණය කරන්නේ නම්, එහි මුදල් ස්වයංක්‍රියව FriMi ඉතුරුම් ගිණුමට මාරු කරනු ලැබේ.
22. Bucket List ගිණුම වසා දැමීමෙන් පසු, වසා දැමූ Bucket List ගිණුම හරහා ගනුදෙනු කිරීමට ගනුදෙනුකරුට අවසර නොදේ.
23. ගනුදෙනුකරුට දැනුම් දීමක් සහිතව Bucket List ගිණුම වසා දැමීමේ අයිතිය බැංකුව සතු වන අතර, එවැනි වසා දැමීමකදී එහි ඇති මුදල FriMi ඉතුරුම් ගිණුමට මාරු කරනු ලැබේ.

## විවිධ

24.මෙහි සඳහන් කර ඇති ප්‍රතිවිරුද්ධ වූ කිසිවක් නොසළකා, ගනුදෙනුකරුගේ Bucket List ගිණුම සමඟ ගනුදෙනුකරු බැංකුව වෙත ඇති ඕනෑම වගකීමක් ඒකාබද්ධ කිරීමට සහ එවැනි වගකීම් සත්‍ය හෝ අවිනිශ්චිත ද, ප්‍රාථමික හෝ ඇපකර සහිත ද සහ තනි පුද්ගල හෝ ඒකාබද්ධ ද යන්න අනුව වෙනත් ඕනෑම ගිණුමක් මත හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් ගණුදෙනුකරු විසින් බැංකුවට ගෙවිය යුතු වෙනත් මුදලකට/මුදල්වලට එදිරිව Bucket List ගිණුමෙන් බැර කිරීමට යම් මුදලක්/හිමි මුදලක් හිලව් කිරීමට හෝ මාරු කිරීමට ගනුදෙනුකරු සිය කැමැත්ත පළ කර බැංකුවට බලය පවරයි.

25.ඕනෑම අවස්ථාවක මෙම නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව සතු වේ. එවැනි වෙනස්වීම් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කරනු ඇත.

26. මෙම නියමයන් සහ කොන්දේසිවල සංශෝධන නීතියෙන් අවශ්‍ය වන්නේ නම් මෙම නියමයන් සහ කොන්දේසි ස්වයංක්‍රියව සංශෝධනය වනු ඇත.

27.මෙහි අන් ලෙසකින් නිර්වචනය කර නොමැත්තේ නම් මිස, මෙම නියමයන් සහ කොන්දේසි වල ඉංග්‍රීසි කැපිටල් අකුරින් දක්වන ලද නියමයන් ද ගනුදෙනුකරු විසින් දැනටමත් පිළිගෙන ඇති FriMi නියමයන් සහ කොන්දේසි වල ("ප්‍රධාන ගිවිසුම") දක්වා ඇති අර්ථයම ගනී.

28. මෙම නියමයන් සහ කොන්දේසි ප්‍රධාන ගිවිසුමේ විධිවිධාන සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර නියමයන් සහ කොන්දේසි (ඉල්ලීම මත ලබා ගත හැකි පිටපත්) සමඟ කියවිය යුතුය. එවැනි නියමයන් සහ කොන්දේසි මෙහි ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකමින් ගනුදෙනුකරු එවැනි සියලුම නියමයන් සහ කොන්දේසිවලට බැඳී සිටී.

**අර්ථ දැක්වීම්**

**"බැංකුව"** යන්නෙන් නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. (PQ 118) අදහස් වේ.

" Bucket List " යන්නෙන් අදහස් වන්නේ FriMi හරහා බැංකුව විසින් පිරිනමනු ලබන නිෂ්පාදනයක් වන අතර එමඟින් ගනුදෙනුකරුවන්ට නියමිත මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සඳහා මාසික වාරික (ස්වයංක්‍රීය හෝ අතින්) සිදු කිරීමට ඉඩ සලසනු ලබයි.

"**Bucket List Account ගිණුම**" යන්නෙන් අදහස් වන්නේ Nations saver ඉතුරුම් ගිණුම් ගණයට ගැනෙනා බැංකුවේ ඉතුරුම් ගිණුම් නිෂ්පාදනයකි.

˜**KYC**˜ යන්නෙන් අදහස් වන්නේ ඔබේ ගනුදෙනුකරු දැන ගන්න යන්නය.

**"කල් පිරීමේ දිනය"** යන්නෙන් අදහස් කරන්නේ ගනුදෙනුකරු විසින් කල්පිරීමේ ඉලක්ක මුදලට ළඟා වීමට තෝරාගත් දිනයයි.

**"කල් පිරීමේ ඉලක්කගත මුදල"** යන්නෙන් අදහස් වන්නේ, ආයෝජන කාල සීමාව සඳහා අවශ්‍ය වාරික ගණන Bucket List ගිණුමට තැන්පත් කර ඇත්නම්, කල් පිරීමේ දිනය වන විට, Bucket List යටතේ ලබා ගැනීමට ගනුදෙනුකරු විසින් ඉලක්ක කරනා මුදලයි.